සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** / தென் மாகாணக் சுல்வித் திணைக்சுளம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

# අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

| 9 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | කාලය පැය 2 |
|---|---|---|

නම / විභාග අංකය ..........................................................................................................................

## I කොටස

**උපදෙස් : සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

**I නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) නාට්‍ය කලාව
1. ඒක පුද්ගල කලාවකි. 2. ද්වි පුද්ගල කලාවකි.
3. සාමූහික කලාවකි 4. මින් එකක්වත් නොවේ.

(02) කිසියම් කලා කෘතියක් ඉදිරිපත් කරන ප්‍රකාශන විලාසය හඳුන්වන්නේ,
1. සංවාද ලෙසයි 2. ශෛලිය ලෙසයි
3. ගැටුම ලෙසයි 4. රංගනය ලෙසයි

(03) නාට්‍යයක් තුළ එකිනෙකට ප්‍රතිවරුද්ධ අදහස් එකිනෙකට මුණ ගැසීම මත ඇතිවන්නේ,
1. ගැටුම 2. අනුකරණය
3. දෙබස් 4. චරිත

(04) "ගැටුමක් නැති තැන නාට්‍යයක් නැත." (No Conflict No drama) යනුවෙන් පැවසූයේ,
1. විලියම් ශේක්ෂ්පියර් 2. බර්නාඩ්ෂෝ
3. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් 4. සැටැනිස් ලවුස්කි

(05) නාට්‍යයක වේෂ භූෂණ යනු,
1. පසුතල නිර්මාණ 2. අංග රචනය
3. ඇඳුම් සහ පැළඳුම් 4. රංගාලෝකය

(06) අභිරූපණ රංගයේදී ප්‍රධාන වශයෙන් යොදා ගන්නා අභිනයන් වන්නේ,
1. ආංගික සහ වාචික අභිනයයි 2. ආංගික සහ සාත්වික අභිනයයි.
3. වාචික සහ ආහාර්ය අභිනයයි 4. ආහාර්ය සහ ආංගික අභිනයයි.


(07) දැස් අතර මනා සබඳතාවයක් ඇති කිරීම සඳහා සිදු කළ හැකි රංග අභ්‍යාසයකි.
1. දර්පණ තල අභ්‍යාසය 2. තාපන අභ්‍යාසය
3. ශ්වසන අභ්‍යාසය 4. පරිකල්පන අභ්‍යාසය

(08) ශිථිලකරණ අභ්‍යාසයෙන් වන්නේ,
1. සකස්කඩ හා නම් පොත කියවීම
2. ආශ්වාස ප්‍රශ්වාස කිරීම
3. ඉටිපන්දමක් දිය වී යාම
4. රිද්මයානුකූලව ඇවිදීම

(09) පසුතල නිර්මාණ භාවිතා නොකෙරෙන නාට්‍ය ශෛලියකි,
1. නාට්‍යධර්මී ශෛලිය 2. අසම්මත ශෛලිය
3. මිශ්‍ර ශෛලිය 3. ලෝක ධර්මී ශෛලිය

(10) ලෝකධර්මී ශෛලියට අයත් නාට්‍යයකි,
1. මෝදරමෝල　　2. නරිබෑණා　　3. මනමේ　　4. රත්තරං

(11) පහත ඡායාරූප ඇසුරු කරගෙන 11-15 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු තෝරන්න.

| A | B | C | D | E |
|---|---|---|---|---|
|  |  |  |  |  |

(11) ලාංකීය ළමා නාට්‍ය කලාවට පුරෝගාමී දයකත්වයක් සැපයූ නිර්මාණකරු දක්වෙන ඡායාරූපය වන්නේ,
1. A　　2. B　　3. D　　4. E

(12) වාර්තා රංගය තම නාට්‍ය නිර්මාණ සඳහා යොදා ගත් නාට්‍යකරුවෙකු දක්වෙන ඡායාරූපය වන්නේ,
1. A　　2. B　　3. C　　4. D

(13) "අංගාර ගඟ ගලා බසී" නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවා දක්වෙන ඡායාරූපය වන්නේ,
1. A　　2. C　　3. D　　4. E

(14) සිංහබාහු නාට්‍ය සඳහා රංගනයෙන් දයක වූ ශිල්පියෙකු දක්වෙන ඡායාරූපය වන්නේ,
1. A　　2. B　　3. C　　4. D

(15) "D" ඡායාරූපයෙන් දක්වෙන්නේ,
1. ගුණසේන ගලප්පත්ති මහතා　　2. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
3. රංජිත් ධර්මකීර්ති මහතා　　4. දයානන්ද ගුණවර්ධන මහතා

*　A කොටසට ගැළපෙන පදය B කොටසින් තෝරා යා කරන්න.

| A | D |
|---|---|
| (16) සක්කාය දිට්ඨි | ග්‍රීස් පේන්ට් |
| (17) රංග විධාන | රංග අභ්‍යාස |
| (18) අංග රචනය | ඔටුන්න |
| (19) සංවේදන | නාට්‍ය ධර්මී නාට්‍ය |
| (20) වේෂ භූෂණ | තලියට ගසා නාද කොට |

(20x2 = 40)

## II කොටස

* පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 3කට පිළිතුරු ලියන්න.

(01) **"(දුක් මුසු ස්වරයෙන්) අපේ මැණියෝ නැතිවෙලා දැන් කෝච්චර කල්ද? මට කිසි කෙනෙක් නෑ ඉන්නෙත් අර මහලු අත්තම්මා විතරයි. උන්දෑ ගාව මස්සක්වත් නෑ."**

i. ඉහත සංවාදය අයත් නාට්‍ය හා එම නාට්‍ය නිර්මාණයට මූලික වූ ජාතක කතාව නම් කරන්න. (ල.2)

ii. ඉහත සංවාදය ඉදිරිපත් කරන චරිතය කුමක්ද?

iii. ඉහත සංවාදයෙහි එන රංග විධානයක් ලියන්න. (ල.2)

iv. "අතට වළලුද පයට ගිගිරිද,
ලාගනී කිඳුරඟන සොබනා ..................
ලා ගනී කිඳුරඟන සොබනා ........................
මෙම ගීතයෙහි ඉතිරි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.

v. මෙම නාට්‍යයේ පළමු වරට රඟ දැක්වූ වර්ෂය කුමක්ද? (ල.2)

vi මෙහි නාට්‍ය අධ්‍යක්ෂවරයා කවුද (ල. 2)

vii. ඔහුගේ වෙනත් නාට්‍ය නිර්මාණ 03ක් නම් කරන්න. (ල, 03)

(02) i. ආනුශංගික අංග යනු කුමක්දැයි හඳුන්වන්න. (ල.04)

ii. නාට්‍යයක් සඳහා භාවිතා වන ආනුශංගික අංග 5 ක් නම් කරන්න. (ල. 5)

ii. ඉහත එක් ආනුෂාංගික අංගයක් නම් කර එය නාට්‍යයක් සඳහා නිර්මාණයේදී සැලකිය යුතු කරුණු විස්තර කරන්න. (ල. 06)

(03) i. බෞද්ධ පූජාකර්ම 4ක් නම් කරන්න. (ල. 4)

ii. ඉහත එක් බෞද්ධ පූජා කර්මයක් පිළිබඳව කෙටියෙන් දන්වන්න (ල.5)

iii. ඔබ කැමති බෞද්ධ පූජා කර්මයක් ආශ්‍රයෙන් එහි නාට්‍යමය ලක්ෂණ විමසන්න.
ල. 6

(04) i. සමාරෝපය යනු කුමක්දැයි හඳුන්වන්න. ල. 4

ii. සමාරෝපය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කර ඒ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.(ල. 5)

iii. නාට්‍යයක රංගනයේ දී නළුවෙකුට සමාරෝපයෙහි ඇති වැදගත් කම විස්තර කරන්න. (ල.6)

05. i. ඔබ ඉගෙන ගත් රංග ක්‍රීඩා 2ක් නම් කරන්න. (ල. 4)

ii. රංගක්‍රීඩාවන්හි නිරත වීමෙන් නළුවෙකුට අත්වන ප්‍රයෝජන 5 ක් ලියන්න. (ල.5)

iii. රංග ක්‍රීඩාවක් සිදු කරන අයුරු විස්තර කරන්න. (ල. 6)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අවසාන වාර පරීක්ෂණය - 2021
නාට්‍ය හා රංග කලාව
09 - ශ්‍රේණිය
පිළිතුරු පත්‍රය
1 පත්‍රය

01) 1) 3 2) 2 3) 1 4) 2 5) 3 6) 2
7) 1 8) 3 9) 1 10) 1 11) 4 12) 2
13) 1 14) 3 15) 1 16) නාට්‍ය ධර්මී නාට්‍ය
17) (තලියට ගසා නද කොට 18) ග්‍රීස් පේන්ට්
19) රංග අභ්‍යාසය 20) ඔටුන්න (ලකුණු 1x20=20)

II පත්‍රය

(1) i. කඳ වළළු / සේරිවාණිජ ජාතකය ii. සිටු දුව
iii. (දුක් මුසු ස්වරයෙන්)
iv වනේ සිඳඹුවො කඩා මල් පෙති
වරල සිරසා ගනිති නිතිනා v. 1958
vi මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
vii මනමේ, සිංහබාහු, රත්තරං, එලොව ගිහින් මෙලොව ආවා, මහාසාර, පේමතී ජායතී සෝකෝ, වෙල්ල වැහුං..... ආදී සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ.

(2) i. නළුවාගේ රංග කාර්ය ත්‍රීව්‍ර කරලීම උදෙසා බාහිරින් ඉවහල් වන අනු අංග ආනුසංගික අංග වේ. මීට සමාන පිළිතුරක් සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
ii. රංගාලෝකකරණය, අංග රචනය, වේෂභූෂණ, පසුතල නිර්මාණ හා රංග උපකරණ, නාට්‍ය සංගීතය, රංග වින්‍යාසය (ලකුණු 05)
iii. ඉහත එක් ආනුෂංගික අංගයක් නම් කර තිබීම (ලකුණු 01)
එම ආනුෂංගික අංගයට අදාලම කරුණු ගොනු කිරීම. (ලකුණු 05)

(3) i. ආසන දෙකේ බණ, ආලවක දමනය, මිලින්ද ප්‍රශ්නය, දොරකඩ අස්න (ලකුණු 04)
ii. නිවැරදිව බෞද්ධ පූජා කර්මයක් පිළිබඳව ලියා ඇත්නම් ලකුණු ලබා ගන්න.
ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 4.1 නිපුණතා මට්ටම සැලකිල්ලට ගන්න. (ලකුණු 05)
iii. ඉහත එක් බෞද්ධ පූජා කර්මයක අනුකරණය සමාරෝපය, චරිත නිරූපණය, අභිනය, සංවාද භාවිතය, නාට්‍යෝපකරණ භාවිතය, පසුතල නිර්මාණ, රංගභූමි භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය..... ආදී නාට්‍යමය ලක්‍ෂණ දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(4) i. තමන්ගේ පෞද්ගලිකභාවයෙන් අත් මිදී යම් චරිතයකට ප්‍රවිශ්ට වීම/වෙස් වලා ගැනීම/ආරූඪ වීම (ලකුණු 04)
ii අභ්‍යන්තර සමාරෝපය - චරිතයට අදාල ලෙස කටහඬ හා ශාරීරික නිරූපණයන් ඔස්සේ පිවිසීම
බාහිර සමාරෝපය - වේෂභූෂණ, නාට්‍යෝපකරණ, අංග රචනය මගින් යම් චරිතයකට ප්‍රවිශ්ට වීම. (ලකුණු 05)
iii. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයකි 1.5. නිපුණතා මට්ටම අනුව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

(5) i. පෙරළුණු ඔරුව, රාක්‍ෂයෙක් ගමට ඇවිල්ලා.... ආදී ඕනෑම රංග ක්‍රීඩා 2ක් සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)
ii. සාමූහිකත්වය ඇති කිරීම. (ලකුණු 05)
ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව, උත්සාහය, ක්‍රියාශීලී බව, කැපවීම, පරිත්‍යාගය වැනි ගුණාංග ප්‍රගුණ වීමට, ජය පරාජය විඳ දරා ගැනීමට හැකි වීම, ස්මරණ දියුණු වීම, දක්‍ෂ නායකත්වයක් ලබා ගැනීමට හැකි වීම.
iii. ඕනෑම රංග ක්‍රීඩාවක් සිදු කරන ආකාරය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)